# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2348/37 - 2023 සැප්තැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2023.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන සහ මිලේනියම් ඩ්‍රයිව් අයි. ටී. පාර්ක්, මාලඹේ, 10115 යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 ජූලි මස 31 දින අංක 2343/03 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. සිනෙක් කැම්පස්(ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 10 වන ස්ථරයේ) ඖෂධවේදී විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සම්බන්ධයෙන්,

   (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් අදාල විෂය ක්ෂේත්‍රයෙන් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත් වන පරිදි ප්‍රථම උපාධියක් ලබා තිබීම; හෝ

   (ආ) අදාල විෂය ක්ෂේත්‍රයෙන් SLQF සයවැනි හෝ ඉහළ ස්ථරයක යෝග්‍යතාවක් ලබා තිබීම; හෝ

   (ඇ) SLQF සයවැනි හෝ ඉහළ ස්ථරයකට සමාන වන වෘත්තීය යෝග්‍යතාවක් ලබා තිබීම; හෝ

   (ඈ) උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන අධිකාරිය විසින් නියම කරන ලද පරිදි 0-4 පරිමාණයෙන් අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය 3.00 හෝ ඉහළ ප්‍රමාණයක් සමග NVQ හත්වැනි ස්ථරය සම්පූර්ණ කර තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.


1A - PG 6477 — 286 (2023/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ඖෂධවේදී විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්. එස්. සී (ඖෂධවේදී විද්‍යාව) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0060/1

---

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කොට ඇති, ලියාපදිංචි අංක පී.වී. 101137 දරන උපාධි පිරිනමන ආයතනයක් ලෙස පිළිගනු ලබන, එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2022 සැප්තැම්බර් මස 07 දින අංක 2296/08 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ උපාධිය" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන් යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී;

01). අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණ කළ යුතු (එස්එල්කිව්එෆ් 06 වන මට්ටම) ප්‍රවෘත්තිකරණය සහ ඩිජිටල් මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් -

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවක් යටතේ එකවර සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ලබා සිටීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

02) අවම අධ්‍යයන සම්භාර 60ක් සහිතව සම්පූර්ණ කළ යුතු (එස්එල්කිවුඑෆ් 10 වන මට්ටම) ව්‍යාපාර පරිපාලනපති අධ්‍යයන පාඨමාලාව සම්බන්ධයෙන් -

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ව්‍යාපාර හෝ කළමනාකරණය සම්බන්ධ විෂයකින් (වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළුව) ලබාගත් පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථය සහිත ගෞරව උපාධියක්; හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ව්‍යාපාර හෝ කළමනාකරණය සම්බන්ධ විෂයකින් (වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලන හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළුව) ලබාගත් ගෞරව උපාධියක් සහ එම සුදුසුකම ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක (01) වෘත්තීය පළපුරුද්ද; හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ව්‍යාපාර හෝ කළමනාකරණය සම්බන්ධ විෂයකින් (වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළුව) ලබාගත් පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථය සහිත සාමාන්‍ය උපාධියක් සහ එම සුදුසුකම ලැබීමෙන් පසු අවම වශයෙන් වසර එකක (01) වෘත්තීය පළපුරුද්ද; හෝ

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ඕනෑම විෂයයක් පිළිබඳ උපාධියක් සහ අවම වශයෙන් ඕනෑම ව්‍යාපාර හෝ කළමනාකරණ සම්බන්ධ විෂයකින් (වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලන හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළුව) ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්; හෝ

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ඕනෑම විෂයයක් පිළිබඳ උපාධියක් සහ එම සුදුසුකම ලැබීමෙන් පසු අවම වශයෙන් වසර දෙකක කළමනාකරණ මට්ටමේ වෘත්තීය පළපුරුද්ද; හෝ

(ඊ) පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් සහ එම සුදුසුකම ලැබීමෙන් පසු අවම වශයෙන් වසර දෙකක වෘත්තීය පළපුරුද්ද. හෝ

I. වරලත් ගණකාධිකාරී ආයතනය (ACA) - අවසන් පරීක්ෂණය සමත්
II. කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනය (CIMA) අවසන් පරීක්ෂණය සමත්
III. වරලත් සහ සහතික ලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA) - අවසන් පරීක්ෂණය සමත්
IV. වරලත් අලෙවිකරණ ආයතනය (CIM) UK- පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
V. වරලත් බැංකුකරුවන්ගේ ආයතනය (ACIB) UK- ආශ්‍රිත සාමාජික - ඩිප්ලෝමාව
VI. වරලත් බැංකුකරුවන්ගේ ආයතනය (AIB) Sri Lanka - ආශ්‍රිත සාමාජික - ඩිප්ලෝමාව
VII. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) - ගණකාධිකරණ පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) (සිව් අවුරුදු පාඨමාලාව)
VIII. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) - කළමනාකරණ / වාණිජ්‍යය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDM/C) (සිව් අවුරුදු පාඨමාලාව)
IX. වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයින්ගේ ආයතනය - සාමාජික
X. නීතිඥ

(උ) පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් සහ එම සුදුසුකම ලැබීමෙන් පසු අවම වශයෙන් වසර පහක කළමනාකරණ මට්ටමේ වෘත්තීය පළපුරුද්ද.

I. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) විසින් පිරිනමනු ලබන අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව

II. ශ්‍රී ලංකා වරලත් පුද්ගල කළමනාකරණ ආයතනයෙන් (CIPM), මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම්

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් වලට අනුකූල විය යුතුය.

3) නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ප්‍රවෘත්තිකරණය සහ ඩිජිටල් මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී (ප්‍රවෘත්තිකරණය සහ ඩිජිටල් මාධ්‍ය අධ්‍යයනය) |
| ව්‍යාපාර පරිපාලනපති | එම්බීඒ |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම),
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0060/2

---

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 62877 දරන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 ජූනි මස 12 දින අංක 2340/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

01. හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,

(අ) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත (SLQF 6 වන මට්ටම) ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

(i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජෛව පද්ධති තාක්ෂණය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

(ආ) අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිත (SLQF 10 වන මට්ටම) අධ්‍යාපනපති උපාධිය සම්බන්ධයෙන්,

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපනවේදී (ගෞරව) උපාධියක් ලබා තිබීම; හෝ

(ii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපනවේදී උපාධියක් ලබා තිබීම; හෝ

(iii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් සහිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (PGDE) සමඟින් උපාධියක් ලබා තිබීම; හෝ

(iv) අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් සහිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් ලබා තිබීම; හෝ

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපනපති උපාධියක් (SLQF 9) ලබා තිබීම; හෝ

(vi) අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් සහිතව හොරයිසන් කැම්පස් හි අධ්‍යයන සෙනෙට් සභාවට පිළිගත හැකි (i), (ii), (iii), (iv) හෝ (v) යටතේ ලැයිස්තුගත කර නොමැති උපාධියට සමාන වෙනත් ඕනෑම සුදුසුකමක් (SLQF 5 හෝ ඊට වැඩි) ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධිය | බීබීඑස්ටී (ගෞරව) |
| අධ්‍යාපනපති උපාධිය | එම්ඊඩී |

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0060/3

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1975 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කොට ඇති, ලියාපදිංචි අංක පී. බී. 148 දරන උපාධි පිරිනමන ආයතනයක් ලෙස පිළිගනු ලබන, සණස කැම්පස් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2014 ජනවාරි මස 21 දින අංක 1846/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "ප්‍රාදේශීය විද්‍යා සහ සැලසුම් පිළිබඳ (විශේෂ) උපාධිය" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන් යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

01. සණස කැම්පස් ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී අවම අධ්‍යයන සම්භාර 90ක් සහිතව සම්පූර්ණ කළ යුතු (එස්එල්කිවුඑෆ් 05 වන මට්ටම) බැංකු සහ මූල්‍ය කළමනාකරණ උපාධිය සම්බන්ධයෙන් -

    (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවක් යටතේ එකවර සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; සහ

    (ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. සණස කැම්පස් ලිමිටඩ් ආයතනය මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සතියේ දින පහ තුළදී මාර්ගගත ක්‍රමය ඔස්සේ සහ සතිඅන්ත දිනයන්හි භෞතිකව පැවැත්විය යුතුය.

3. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා සණස කැම්පස් ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| බැංකු සහ මූල්‍ය කළමනාකරණ උපාධිය | බීඑම් (බැංකු සහ මූල්‍ය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම),
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0060/4

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 4833 උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 පෙබරවාරි මස 20 දින අංක 2320/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "නීතිවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### I වන උපලේඛනය

***කොන්දේසි***

01. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී,

(අ) ඖෂධ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 6 වන ස්ථරයේ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය සඳහා (එස්) සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ආ) නීතිය සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය සහ නීතිය සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 6 වන ස්ථරයේ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ (එස්) සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

### II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ඖෂධ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඖෂධ විද්‍යාව) |
| නීතිය සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බීඑම් ගෞරව (නීතිය සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය) |
| නීතිය සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බීඑම් ගෞරව (නීතිය සහ ජාත්‍යන්තර වෙළඳාම) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම),**
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0060/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.